# මහජන සේවා කොමිසම පණත් කොටුම්පත (2002 ඔක්තෝම්බර් 08, පාර්ලිමේන්තුව)

ශ්‍රී ලංකාවට මහජන සේවා කොමිසමක් ස්ථාපනය කිරීමේ පනත් කෙටුම්පත මෙම පාර්ලිමේන්තුවට හඳුන්වාදීමේ ගෞරවය අද මට හිමි වී තිබේ. අද මම වෙළෙඳ ආර්ථික රටාවක් තුළ පාලක කොමිසමක මූලික කාර්ය භාරය ගැන අවධානය යොමු කරමි. මම මෙහිදී වෙළෙඳ ආර්ථිකයක වාසි පිළිබඳ විවාද කිරීමට උත්සාහ නොකරමි. මා විශ්වාස කරන ආකාරයට එවන් විවාද මෙම පාර්ලිමේන්තුවේ ඕනෑ තරම් සිදුවේ.

මෙම අවස්ථාවේ අපට තිබෙනුයේ වැදගත් ප්‍රශ්නයක් පිළිබඳ තීරණයක් ගැනීමටයි. අපට මෙවන් පනතක් අවශ්‍ය ඇයි ද යන්නයි?

අප සේවය කරන ජනතාව මත අපගේ සාර්ථකත්වය රැඳී ඇති බව අප සැලකිල්ලට ගත යුතුය. රැකියා සැපයීම හා වේගවත් ආර්ථික වර්ධනය සලකා බලමු. නව රැකියා උත්පාදනය සඳහා නව මෙම රජය හා මෙම පාර්ලිමේන්තුව නව මුහුණුවරකින් කටයුතු කිරීම අරඹා ඇත. එහෙත්, අපට රැකියා සැපයීම හා වේගවත් ආර්ථික වර්ධනය ගැන කථා කළ හැකි වනුයේ ඊට අවශ්‍ය මූලික අවශ්‍යතාවයන් සැපයීමෙන් පසුවය. මෙම පනත් කෙටුම්පතින් එහි එක මූලික අවශ්‍යතාවයක් සපුරා දේ.

එසේ නම්, අපි මෙම පනත් කෙටුම්පතට අවධානය යොමුකරන විට ක්‍රියාකාරී සබඳතාවන් පිළිබඳ ව ද අවධානය යොමු කරමු. විදුලි බලය හා ජලය වැනි පාරිභෝගික අවශ්‍යතාවයන් ලබාදීමට ද, පාරිභෝගික අයිතීන් ආරක්ෂා කිරීමට ද මෙම පනත අපට ඉවහල් වේ. මේවා ලබාදීමට හා පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට පෙර අප ආයෝජන ඉහළ නැංවිය යුතු වේ. වැඩි ආයෝජන අවස්ථාවන් ලබාදීමෙන් කර්මාන්තයක් පහසු මිලට, ඉහළ තත්ත්වයේ, විශ්වාසය තැබිය හැකි සේවාවක් ලෙස දීප ව්‍යාප්ත ව සැපයීම දිරි ගන්වයි. අපට ලබාදිය හැකි වනුයේ ආයෝජකයින්ට අවශ්‍යතාවය සපුරා ගැනීමට සුදුසු වාතාවරණයක් සැලසීමේ දී පවා සිදුවන වංචා හා අත්වැරදීම්වලින් පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම ය. අවසාන වශයෙන් පාලක ක්‍රියාවලියේ සම්පූර්ණ වටිනාකම හා තත්ත්වය සැලකිල්ලට ගනිමින් ප්‍රතිපත්තිමය හා ව්‍යුහාත්මක ප්‍රතිරූපයකින් මෙම අවශ්‍යතාවන් හඳුන්වා දිය යුතුය.

ව්‍යාපෘතියකට මුදල් බැර කිරීමේ දී වසර පහළොවක විස්සක පමණ ප්‍රතිලාභයක් ඇති බවට ආයෝජකයාට විශ්වාසයක් තිබිය යුතුය. සේවාවන් හා පාරිභෝගිකයා අතර අනුමාන වශයෙන් නොව මිල මත පදනම් වූ අනුපාත තීරණය කිරීමට සාධාරණ, පැහැදිලි, යෝග්‍ය, වෘත්තීයමය, කළමනාකරණ ක්‍රියාවලියක් තිබිය යුතුය.

රේඛීය අමාත්‍යාංශ වල සහ බාහිර විශේෂඥයින්ගේ උසස්ම දැනුම මෙම මහජන සේවා කොමිෂන් කෙටුම්පතින් පෙන්නුම් කෙරේ. අනෙකුත් විශේෂඥයින්ගේ තාක්ෂණික දැනුම සහ වෙනත් රටවල අත්දැකීම් පවා මෙයට ලබාගන්නා ලදී. මේ සම්බන්ධයෙන් වඩාත් ම වැදගත් වන්නේ මෙම ඒකාබද්ධ ව්‍යායාමය ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන විදුලිබල පනත වැනි අනෙකුත් පනත් වලට අවස්ථාවක් ලබා දීමයි.

සේවාවන්හි ආයෝජන දිරිගැන්වීමට, පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට සහ නව කොමිසමකින් ආරම්භ කෙරෙන රජයේ අධිකාරිවල නීත්‍යානුකූල බව පැහැදිලි කිරීමට, පාලක ව්‍යුහයක් මෙම මහජන සේවා කොමිසම මගින් නිර්මාණය කෙරෙනු ඇතැයි අපි විශ්වාස කරමු. විශ්වාස කළ හැකි හා පහසුවෙන් ලබාගත හැකි සේවාවන් සැපයීමට සුදුසු ක්‍රමයක් නිර්මාණය කිරීමට මෙම පනත උපකාර වේ. මෙම පනත මෙම අවස්ථාවේ දී අපගේ ආර්ථිකය යළි ගොඩනැංවීමට ආධාර වනු ඇති අතර, පසුව ආර්ථිකයේ වර්ධනයට හා ස්ථාවර පැවැත්මට හේතු වනු ඇත.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අප ලබාගත් අත්දැකීම්වලට අනුව, අප සේවය කරන ජනතාවට මෙමගින් සැලසෙන ප්‍රයෝජන අපට දැනටමත් පෙනේ. මෙහි සිටින සාමාජිකයන් බොහෝ දෙනා රජයන් කිහිපයක් තුළ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධන ප්‍රයත්නයන්හි නියැලුණු අතර, එය කෙතරම් සංකීර්ණ වුවත් එහි සාර්ථකත්වයට හේතු වූයේ සුළු කරුණකි. මෙම සුළු කරුණ කුමක් ද? එය කෙටියෙන් පවසනවා නම් එනම්, දීප ව්‍යාප්ත ව ලබාගත හැකි හොඳ තත්ත්වයේ විශ්වාසනීය සේවාවක් ලබාගත හැකි වීමේ වාතාවරණයයි. එය මෙම පනත් කෙටුම්පත හා එහි පාලක අධිකාරිය නිර්මාණය කරයි ද? ඊට පිළිතුරු ඔබ දැනටමත් දනී.

විදුලි සංදේශ ක්ෂේත්‍රයේ අත්දැකීම් හා අපගේ වැරදි තුළින් අපි බොහෝ දෑ උගෙන ඇත්තෙමු. අප විමසිලිමත් නොවුවහොත් ගෑස් ක්ෂේත්‍රයේ සිදුවීම් සේ මීට ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ලබාදිය හැකිය.

ඔබට ඉදිරිපත් කර ඇති මෙම පනත් කෙටුම්පත, කොමිසමේ සාමාජිකයින් හා එහි නිලධාරී මණ්ඩලයේ සුදුසුකම්, පත්වීම් කාලය හා ව්‍යුහාත්මක ශක්තිය මගින් ස්වාධීන, වෘත්තීමය සහ විනිවිද දකින ක්‍රියාවලියක් නිර්මාණය කිරීමට උත්සාහ

කරයි. එසේ ම, කර්මාන්ත ක්ෂේත්‍රයෙන් මෙම පාර්ලිමේන්තුවට වගකියන ස්වාධීන කොමිසමක් සකස් කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

විශේෂයෙන් ම, පාරිභෝගික අයිතිවාසිකම් සුරකින අනෙකුත් අදාළ සංවිධාන සමග සබඳකම් වලට ද මෙම පනත් කෙටුම්පත ඉඩ සලසයි. අවසාන වශයෙන් මෙම පනත් කෙටුම්පත තවත් දොරටුවක් විවර කරයි. එනම්, මෙම මහජන සේවා පනත් කෙටුම්පත ඔබගේ පාර්ලිමේන්තුව භාර ගැනීමට තීරණය කරන විට එමගින් විදුලි බලය හා ජලය යන ක්ෂේත්‍රවලට වඩා වැඩියෙන් ඊට සමාන කාර්යයන් ඉටු කළ හැකි බව ය.

ඉතා ප්‍රායෝගික කරුණු තුනක් නිසා මෙම බහු ක්ෂේත්‍ර අංශය වැදගත් වේ.

ඉන් පළමුවැන්න නම්, ලොව පුරා මෙම නියාමන කටයුතු සම්බන්ධ දක්ෂ පුද්ගලයින්ගේ හිඟයක් පවතී. අපි මීට පෙර ප්‍රවාහන නියාමන ක්ෂේත්‍රයේ වූ අත්වැරැද්දක ගැන අවධානය යොමු කළ යුත්තෙමු. මේ සම්බන්ධ කරුණු නැවත පරීක්ෂා කිරීමට අවශ්‍ය නැත. එහි අවසාන නිගමනය කුමක්දැයි අපි දනිමු.

අපට සේවක නියාමන ආයතනයේ කළමනාකරණ හැකියාව හා දේශීය සේවක ප්‍රමාණය පිළිබඳ ව අධිතක්සේරුවක් තිබුණු අතර, මෙම සේවා ඉටු කිරීමට පත්කරන පුද්ගලයින්ට ඇති අපහසුතාවය පිළිබඳ අවතක්සේරුවක් ද තිබිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් කාර්යක්ෂම, ප්‍රබල, නිසියාකාර නියාමන හිඟය ඉතා වටිනා අදහසකට හරස් විය.

මෙම අත්දැකීම් මෙම බහු ක්ෂේත්‍ර කටයුත්තේ එක් ප්‍රයෝජනවත් අංගයක් හඳුනා ගැනීමට උපකාර වේ. එනම්, අවශ්‍ය දක්ෂ පුද්ගලයින්ගේ හිඟයයි.

දෙවන ප්‍රායෝගික හේතුව නම්, නියාමන පිරිස මඳ වීම ය. ඊට හේතුව නම් අපගේ රාජ්‍ය අංශයේ දැනට සිටින සේවක පිරිස 8,50,000ක් පමණ වීම ය. ඒකපුද්ගල වශයෙන් අපට ලෝකයේ විශාලතම රාජ්‍ය අංශයක් ඇත. රාජ්‍ය අංශය දැනට දළ ජාතික නිෂ්පාදිතයෙන් 27% පමණ වේ. එහෙත්, දක්ෂ පුද්ගලයින් නොමැති නිසා නියාමන කටයුතු බහු ක්ෂේත්‍ර කර්තව්‍යයක් ලෙස ඉටුවනු ඇත.

මේ පනත් කෙටුම්පතේ වැදගත් ම අංශය අපගේ සම්පත් ඥානවන්ත ලෙස, කාර්යක්ෂම ලෙස හා සකසුරුවම් ලෙස ප්‍රයෝජනයට ගැනීමයි. ඒ අනුව, රේඛීය අමාත්‍යාංශ මට්ටමින් ක්‍රියාත්මක වන මහජන සේවා කොමිසමක් මගින් මෙය වඩා පුළුල් කළ හැකිය. කොමිෂන් රාශියක් ඇති කිරීමෙන් කිසිදු ප්‍රතිඵලයක් නොමැත. එය අපට දැරිය නොහැකි වියදමක් වනු ඇති අතර, ප්‍රමාණවත් සේවක පිරිසක් ඒ සඳහා පත්කිරීමට ද නොහැකි වේ.

බහු ක්ෂේත්‍ර කටයුත්තේ තෙවන ප්‍රායෝගික ප්‍රශ්නය නම්, යෝජිත කොමිසමේ ස්වාධීනත්වයයි. විශේෂ කර්මාන්තයක අවශ්‍යතාවයන්ට සමීප කොමිසමක් ලෙස අනාගතයේ දී ඇතිවන ගැටලු පිළිබඳ අවබෝධයක් ලබාගැනීමටත්, ආරම්භයේ දී පැන නගින ගැටලු වළක්වා ගැනීමටත්, හැකියාව බහු ක්ෂේත්‍ර කාර්යයක දී හැකි වේ. පෙනෙන මානයේ ප්‍රයෝජන ඇති මෙම පනත් කෙටුම්පත ලබාගැනීමට අප රේඛීය අමාත්‍යාංශ හා එක්ව කටයුතු කළේ එම නිසා ය. එමගින්, කළමනාකරණ හා නියාමන අතරමැදි වීමක් සිදු නොවේ.

එබැවින්, පාර්ලිමේන්තුව මෙම පනත පිළිබඳ ව සැලකිලිමත් වන බැවින්, ඇත්ත වශයෙන් ම, අප තීරණය කළ යුත්තේ කුමක් ද? අපට හැකි ඉහළ ම විසඳුම අප තීරණය කරනුයේ අදහස මත නොව, අපගේ හා අනෙකුත් අයගේ අත්දැකීම් මත ය. කාර්මික විශේෂඥයන්ගේ විසඳුමක් ලෙස ය.

අප අද්විතීයයි. නමුත් ඇතැම් විට අනෙකුත් රටවල් වලට වඩා ද එය නීරස විය හැකියි. එහෙත්, එය සත්‍යයි. අප අපගේ ප්‍රශ්න පැහැදිලි කළ යුතුය. විසඳා ගත යුතුය. අප දන්නා පරිදි අපගේ වඩාත් ම හොඳ ක්‍රියා වන අප උගෙන ඇති දේ භාවිත කරමින් ප්‍රශ්න විසඳා ගත යුතුය. අප ඉදිරියේ ඇති කටයුත්ත එයයි.

මෙහි සිටින ඔබ සැමට මෙම පනත් කෙටුම්පත කියවා බැලිය හැකිය. එවිට ඔබ ඉදිරියේ ඇති මෙම කෙටුම්පතේ පැහැදිලි ව දක්වා ඇති නීති රීති පිළිබඳ කරුණු පැහැදිලි කරන්නෙමි. ඊට අමතර ව, මෙම පනත් කෙටුම්පත සම්පාදනය කළ පුද්ගලයින් එහි ඇති ප්‍රයෝජන ලෙස සැලකෙන කරුණු පැහැදිලි කිරීමට විනාඩි කිහිපයක් ලබා දෙන්නේ නම් ස්තුතිවන්ත වෙමි. ඒ අනුව, මම මෙම පනත් කෙටුම්පතට පාර්ලිමේන්තුවේ අනුමැතිය ඉල්ලා සිටිමි.

මෙම පනත් කෙටුම්පතේ ඇති ප්‍රයෝජන මොනවා ද? පනත් කෙටුම්පත පිටු 40කින් සමන්විත වන නමුත්, අපට එහි

අරමුණු ගැබ්වන පරිදි, වචන තුනකට කෙටි කළ හැකිය.

එම වචන තුන නම්, සැපයීම, ආරක්ෂාව හා වැළැක්වීම ය.

*අප මූලික අවශ්‍යතා සැපයිය යුතුය.

*අප පාරිභෝගිකයා ආරක්ෂා කළ යුතුය.

*අප සමීකරණයේ පාරිභෝගික වියදම හා නිෂ්පාදන වියදම යන දෙපසටම වැරදි වීම් වැළකිය යුතු වේ.

අපි මේවා එකින් එක ගෙන සලකා බලමු.

දවසින් අඩක දී පමණ එහෙත්, එම කාලයේ දී පවා හරිහැටි විදුලිබල සැපයුමක් නොමැති බලශක්ති උපයෝගීතාවය නිසා, ඒ වෙනුවට උත්පාදක යන්ත්‍ර මිලදී ගත හැකි ව්‍යාපාර හා පාරිභෝගිකයෝ ඒවා මිලදී ගනිති. මෙය කුඩා පරිමාණ ව්‍යාපාර, මහා පරිමාණ ව්‍යාපාර හා ගෘහ කටයුතුවල දී අවාසිදායක අතිරේක වියදමකි. සියල්ලෝ ම මෙම ප්‍රශ්නයට මුහුණ දෙති. එය කුඩා ව්‍යාපාරයකට නිෂ්පාදන වියදම දරා ගැනීම නොහැකි වීම හෝ තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කර ගැනීමට පහසුකම් ලබා දීම නිසා දෙමාපියන් ළත විය හැකිය.

මෙම පනත් කෙටුම්පත නියාමන ප්‍රතිසංස්කරණ මෙන් ම, දැනට අපට ඇති රැකියා, අලුතින් නිර්මාණය කළ යුතු රැකියා හා රටේ තත්ත්වය පිළිබඳ ව අදාල වේ. රජය නව රැකියා බිහි කිරීමට හා වේගවත් වර්ධනයක් ඇති කිරීමට කැප වී සිටී. මෙහි දී වෙළෙඳ මට්ටමින් හා ආර්ථිකය තුළ උපයෝගිතා සේවා වියදම, නිෂ්පාදන වියදම සඳහා හා භාණ්ඩ හා සේවා වියදම සඳහා වැදගත් අංගයක් වේ. අපි කවුරුත් දරුවකු අඳුරේ පොතපත හදාරනු දකිනු අකමැත්තෙමු.

කාර්යක්ෂම උපයෝගිතාවය දිගුකාලීන ආර්ථික වර්ධනයට, රැකියාවන්ට හා ආදායම්වලට අවශ්‍ය මූලික අංගයක් වේ. මෙහි ප්‍රතිඵල, හොඳ නරක දැක බලා ගැනීමට නම් අප කළ යුත්තේ අනෙකුත් රටවල් අත්දැකීම් හා සසඳා බලා අප රටට අවශ්‍ය කුමක්දැයි සිතා බැලීම ය.

සමහර රටවල විදුලි බලය අඩු මිලට සැපයීම යථාර්ථයකට වඩා මුළාවක් වී තිබේ. බොහෝ රටවල එය ආයෝජකයින් ඈත් කරන සදාකාලික ආර්ථික බාධකයක් හා ජාතික විහිළුවක් බවට පත්ව තිබේ.

ආයෝජන දිරිගැන්වීම් නොමැති වීම නිසා බලාගාර අඩපණ වීමේ ප්‍රතිඵලයක් ලෙස ඉන්ධන වලින් ඉසුරුමත් වුව ද, ඉල්ලුමට සරිලන සේ සැපයීමට බලශක්ති පද්ධතිය අසමත් වන බව තවත් සමහර රටවල දැකිය හැකි වේ. සමහර රජයන් උපයෝගිතාවය පිරිහෙන විට මහජනතාව සතුටු කිරීම සඳහා වියදම අඩු කරනු ලැබේ. එහෙත්, එය විනාශයට මුල වේ. එවිට දුර්වල සේවාවක් සඳහා වැය වන අවසාන වියදම ඉතා ඉහළ බව පෙනේ.

මෙම තත්ත්වය තවත් නරක අතට හැරෙන විට, ඉන්ධන දහනය මගින් පරිසර ගැටලු ඇති කරමින්, ඉන්ධන මිලදී ගැනීම නිසා තව තවත් ආර්ථික අපහසුතා ඇති කරමින් මෙම අතිරේක බලශක්ති වියදමට පාරිභෝගිකයා මෙන් ම, ව්‍යාපාරයන් ද හුරු වේ.

මෙවැනි අවස්ථාවකට වගකිව යුතු වන්නේ කවුරුන් ද? අපට මෙම ගැටලුව සැමදාම අතපසු කළ නොහැකි ය. අද ඔබට ඉදිරිපත් කරන මෙම පනත් කෙටුම්පත මගින් මෙම ගැටලු වලට විසඳුම හඳුන්වා දීම ආරම්භ කරයි.

මෙය අනාගතයට අත්වැලක් මිස අනාගතය නොවන බව මා මෙහිදී පැහැදිලි කළ යුතු වේ. ඔබ දන්නා පරිදි, අනෙකුත් අදාළ පනත් කෙටුම්පත් පසුව ඉදිරිපත් කෙරෙනු ඇත.

අප ඉදිරියේ ඇත්තේ පනත තුලනය කිරීමයි. අප දන්නා පරිදි බලශක්ති උත්පාදනයට කර්මාන්තවලට අදාළ කාල සීමාව වර්ෂවලින් මැනෙන අතර, අපගේ ඉල්ලුම වර්ධනයවෙද්දී පවා 1997 ජූලි මස කළ අධ්‍යයනයකට අනුව වසරකට එය 8% ත් 10% ත් අතර වේ.

එබැවින්, ගොනුවන අවශ්‍යතාවන්, ගොනුවන වියදම් හා ගොනුවන ණයට අපට මුහුණදීමට සිදුවේ. පසුගිය කාලයේ දී මෙම ආයෝජනවලින් 15%ත් 20%ත් අතර ප්‍රමාණයකට රජය දායක වූ අතර, ඉතිරිය අර්බුදයක් ඇති වූ අවස්ථාවන් හි දී ඉදිරිපත් වන දායකයන්ගේ ණයවලින් සැපයිණ. අප අපගේ බලශක්ති අවශ්‍යතා නිසියාකාර ව පවත්වාගෙන යාමට නම් අප පැහැදිලි පාලක පරිසරයක් කරා පියවර මැනිය යුතුය. ක්‍රියා කළ යුතුය. එමගින් අපට ලබාගත නොහැකි අපගේ අවශ්‍යතාවයන් සඳහා ආයෝජන ව්‍යුහයක් ලැබෙනු ඇත. එය අප තනිව ලබා ගැනීමට උත්සාහ කිරීම අනුවණ කමක් විය හැකිය.

මෙම අවශ්‍යතා සපුරා ගැනීමට නම් ආයෝජනය සඳහා ක්‍රමයක් සකස් කළ යුතුය. මෙම ක්‍රමයේ ප්‍රධාන අංගය මෙම පනත් කෙටුම්පතේ අන්තර්ගත වේ. උපයෝගීතාවන් ඒවායේ වියදම පියවා ගත යුතු වන අතර, අඩු වැඩි නොවන පරිදි පාරිභෝගිකයින්ට සේවා සැපයීමේ ක්‍රම ව්‍යාපාර කටයුතුවල සීමාව දත යුතුය. දෙවනුව පාරිභෝගිකයාට තමා සුරක්ෂිත බව හැඟී යා යුතුය.

මහජන උපයෝගිතා කොමිසම මෙම අවශ්‍යතා දෙක ම සපුරා ගැනීමේ ක්‍රමයයි. වෙළෙඳපොළ බලතල හා වෙළෙඳපොළ මිල ගණන් හා සම්බන්ධයෙන් නොමැති අනිසි, අවිනිශ්චිත, නොගැළපෙන මිල ගණන් පිළිබඳ තීරණ පිටුදැකීමේ ක්‍රමය ද මහජන උපයෝගිතා කොමිසම වේ. අප කථා කරනුයේ කුමක් ගැන ද එනම්, අනුමාන කටයුතු සඳහා යොදාගත හැකි ක්‍රම පිළිබඳ ව ය.

අපි අපගේ වචන තුන යළි සිහිපත් කරමු. සැපයීම, ආරක්ෂාව, වැළැක්වීම. අපගේ පළමුවන වචනය දෙවන වචනය වන "ආරක්ෂාව" පැහැදිලි කිරීමට උපකාරී වේ. එසේ නම්, ආරක්ෂා කිරීම, ආරක්ෂා කළ යුත්තේ කවුරුන් ද බලශක්තිය හෝ ජලය පරිභෝජනය කරන ඕනෑම අයකු සේවාවන් බලාපොරොත්තු වන ඒ වෙනුවෙන් කුවිතාන්සියක් ගෙවන ඕනෑම අයකු ආරක්ෂා කළ යුතු වේ. පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ දී නියාමන ව්‍යුහයක් මගින් සෑම ප්‍රතිඵලයක් ම නිගමනය කරන තොරතුරු සමූහයකින් අපට ගැලවීමක් බලාපොරොත්තු විය නොහැකිය. එවිට අපි ප්‍රතිපත්ති සම්පාදකයින්ට වඩා කළමනාකරුවන් බවට පත්වන්නෙමු.

අප ඉදිරියේ ඇති කාර්ය භාරය එම කටයුත්ත ගැන නොව රේඛීය අමාත්‍යාංශ සමග සහයෝගී නිසියාකාර ව්‍යුහයක් නිර්මාණය කිරීම පිළිබඳ ව ය. එමගින් දේශපාලනමය වශයෙන් නොව වෘත්තිමය වශයෙන් එම කටයුත්ත පිළිබඳ ව ක්‍රියා කිරීමට අවකාශ සැලසෙනු ඇත.

එසේ නම්, මෙම පනත් කෙටුම්පත පාරිභෝගිකයින් ආරක්ෂා කරන ආකාරය සලකා බලමු. එය දෙයාකාරයකින් පාරිභෝගික ආරක්ෂාව සලසයි.

පළමුව ආරක්ෂාව නීතිමය වශයෙන් ඇති වේ. ඔබ හොඳින් දන්නා සන්නිවේදන ක්ෂේත්‍රය පිළිබඳ උදාහරණය සලකා බලන්න. ප්‍රචාරය කිරීම ඇති වූ විට මුදල් වංචා අඩු විය. එබැවින්, දූෂණයට හේතු වූ තත්ත්වයන් වෙනස් වූ නිසා අයිතිවාසිකමක් බවට පත්ව තිබූ කටයුතු සේවාවක් බවට පත්විය.

මෙම තත්ත්වයන් මොනවා ද? සන්නිවේදන පනත් කෙටුම්පත හා පෙර පැවති රජයන්ගේ හා මෙම පාර්ලිමේන්තුවේ උපකාරයෙන් කෘත්‍රිම සැපයුම් හිඟය ඉහළ සැපයුමක් බවට පත්විය. එමගින් දූෂණයට ඇති ඉඩකඩ ඇහිරීන. සමීකරණයෙන් හිඟය ඉවත් කිරීම මගින් හා වෙළෙඳ භාණ්ඩයේ සැපයුම පුළුල් කිරීම මගින් එය පහසුවෙන් ලබාගත හැකි වේ. එමගින් දූෂණය පිළිබඳ ප්‍රශ්නය විසඳාගත හැකිවනු ඇති අතර, දූෂණය පාලනය කිරීමට යන වියදමෙන් ද සහනයක් ලබාගත හැකිය.

දෙවනුව, ආරක්ෂාව ඇතිවන්නේ පාලන ක්‍රමයෙනි. දක්ෂ නිලධාරීන්ගෙන් සමන්විත, දේශපාලන බලපෑම්වලින් හා කර්මාන්තවලින් නිදහස් වූ මහජන උපයෝගිතා කොමිසම, පාරිභෝගික ප්‍රකාශ පරීක්ෂා කරනු ඇති අතර, චෝදනා විනිශ්චය කරනු ඇත. එසේ ම, ප්‍රතිපත්තිමය හා සලකුණක් ලෙස ආදර්ශවත් ඒකකයක් අයුරින් කොමිසම ස්ථාපනය වනු ඇත.

ස්වාධීන නියාමන කොමිසමක අවශ්‍යතාවය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විශේෂඥයින් විසින් විශ්ලේෂණ අධ්‍යයන කිහිපයක දී නැවත නැවත සඳහන් කර තිබේ.

සෑම අධ්‍යයනයක් පාසා ම සැපයීම හා ආරක්ෂාව යන දෙකට අදාළ දුර්වලතා දෙකක් මෙම විශේෂඥයින් හඳුන්වා දී තිබේ. එනම්, මිල දත්ත විශ්ලේෂණයට හා වියදම හා මිල අතර පරස්පර විරෝධීභාවය පාලනය කිරීමට ස්වාධීන නියාමක කොමිසමක ඇති අවශ්‍යතාවයයි.

මෙම අධ්‍යයනවලින් අප අවබෝධ කරගත් දෙයක් නම්, නිෂ්පාදන වියදමට මෙන් ම, පාරිභෝගික පරිහරණ රටාවේ සැලසුම්කරණය හා අවබෝධය අතර හිඩැසක් ඇති බව ය.

මෙමගින් දත්ත හිඟ බව, සැලසුම්කරුවන් අනාගත අවශ්‍යතා නොදන්නා බව, නියාමකයින් අදාළ අනුපාත ව්‍යුහයන් ගැන අවබෝධයක් නොමැති තත්ත්වයක් ඇති වේ. පහත දැක්වෙන දේ සැලකිල්ලට ගන්න. සංවර්ධිත රටවල ඉහළ හා අධි ගෙවීම් ඇත. මෙය ඔබට අවබෝධ වේ. ඉල්ලුම් වැඩි විට ගෙවීම් වැඩිවීම. මෙමගින් අප සියලු දෙනා සංරක්ෂණයට පෙළඹේ. ඉල්ලුම අඩුවීම ඉවත් කිරීමට ද නිෂ්පාදන අංශයට උදව් කිරීමට ද පෙළඹේ.

මෙවන් සංකීර්ණ දෑ කළමනාකරණයේ දී අප සාර්ථක වී නොමැත. කර්මාන්ත අධ්‍යයනයන්ට අනුව දෛනික කාල බදු දෝෂ සහ වැඩිපුර ගෙවීම පිළිබඳ ගැටලුව බදු ව්‍යුහයේ පැවත ඇත. ඒවා හඳුනා ගැනීමෙන් පසුව ද දශකයක් පමණ මෙම වැරදි පැවතී තිබේ. පාරිභෝගිකයා, ව්‍යාපාරය හෝ වෙනත් දෙයක් වෙනුවෙන් චෝදනාවක් ඉදිරිපත් කර නීතිය ක්‍රියාත්මක කිරීමට ඉල්ලා සිටිය හැකි මහජන උපයෝගිතා කොමිසමක් තිබුණි ද?

පසුගිය මාස කිහිපය තුළ දී විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා මෙම තත්ත්වයන් නිවැරදි කිරීමට දැඩි ව උත්සාහ කළේය. එය අප රජයේ වඩාත් ම අභියෝගාත්මක කාර්යයකි.

මෙවැනි තත්ත්ව පාලනය කිරීමට දක්ෂ නිලධාරීන්ගෙන් යුත් මහජන උපයෝගිතා කොමිසමකින් හැකිවනු ඇත. විදුලි බලය, ජලය හා අනෙකුත් උපයෝගීතාවයන් පිළිබඳ කථා කරන විට ඒවායේ සේවාවන් මිල කිරීමට කාර්යක්ෂම කිරීමට හැකි වේ. එසේ ම, මෙම උපයෝගීතාවය එය පාලනය කළ හැකි අධිකාරියකට පැහැදිලි ව කළ හැකි වනු ඇත.

නියමිත මහජන උපයෝගිතා කොමිසමක් ඇති නොකර නිෂ්පාදකයා පෙළඹවීමට අධිකාරියක් නොමැත. ප්‍රයෝජන සලසා දෙමින් පාරිභෝගිකයා පැසසීමට අපට නොහැකි වනු ඇත. ප්‍රයෝජන මොනවාදැයි නොදැන අප එය කරන්නේ කෙසේ ද? ඒවායේ මිල නියම කරන්නේ කෙසේ ද?

අප දන්නා පරිදි, අන් රටවල ඒකාධිකාරයක් ලෙස හෝ රජය සතුව හෝ වෙනත් ආකාරයකින් පවතින විදුලිබල වෙළෙඳපළ සඳහා බදු සංශෝධන සඳහා මහජන අදහස් සැලකිල්ලට ගනිමින් සකස් කළ උපයෝගිතා යෝජනා අන්තර්ගත ඉතා දැඩි පාලන ක්‍රමයක් ක්‍රියාත්මක වේ. මෙම කටයුත්ත කළමනාකරණයට වෘත්තිමය පාලනය සහිත සාධාරණ පාලනයක් හා නිසියාකාර බදු ව්‍යුහයක් ඇති කිරීම සඳහා සාර්ථක රටවල පාලන කටයුතු කර්මාන්තවලින් වෙන් ව පවතින බව මින් අදහස් කෙරේ.

මහජන උපයෝගිතා පනත තුළින් අප දැනුම් දෙනුයේ දිගුකාලීන අවශ්‍යතාවන්, පැහැදිලි අවශ්‍යතාවක් සහ සපුරාගත් විට නිෂ්පාදකයා, පාරිභෝගිකයා මෙන් ම, රේඛීය අමාත්‍යාංශ සඳහා සේවය කරන අවශ්‍යතාවකි. සංවර්ධිත රටවලට පොදු වූ මිල නියම කිරීමේ ක්‍රියාවලියේ පැහැදිලිභාවය හා තරඟකාරී බව සියලු දෙනාට ප්‍රදර්ශනය කළ හැකිය. වැදගත් ම දෙය, මෙම බුද්ධිමත් කටයුත්ත අප විසින් ම කරගත හැකි වීමයි. දැන් අප ක්‍රියා කරනුයේ අපැහැදිලි භාවය හා එය ඉවත් කිරීම පිළිබඳ ව ය. අප මෙම ක්ෂේත්‍රයේ කාර්යක්ෂම බව කරා පියවර මනින්නේ නොමැති ව පිටුපසට පියවර මනින්නේ නම් අප සියලු දෙනාට වඩා සෞභාග්‍යවත් තත්ත්වයක් උදාකරගත නොහැකිය.

පාර්ලිමේන්තුව මෙම පනත සැලකිල්ලට ගැනීමේ දී අද අප මෙහිදී කළ යුත්තේ කුමක්දැයි පැහැදිලි කළ යුතු වේ. මෙහි මන්ත්‍රීවරයකු හෝ අමාත්‍යවරයකු ලෙස අපට අපගේ කාර්යයන් සඳහා බැඳීමක් ඇත. අපි මහජන විශ්වාසයේ ආරක්ෂකයෝ වෙමු. මෙය කිසිවකුට හෝ අලුත් දෙයකැයි මම නොසිතමි. එහෙත්, එය සිහිපත් කළ යුතුව ඇත. සමහර අවස්ථාවල දී අපගේ ආර්ථිකය හා රට ගොඩනැගීමට නම් දැඩි එමෙන් ම, අත්‍යවශ්‍ය තීරණ ගැනීමට සිදුවේ.

2001 ලෝක තරඟකාරීත්ව වාර්තාවට අනුව, විදුලිබල මිල සඳහා ශ්‍රී ලංකාව 61 වන ස්ථානයේ විය. එනම්, සමීක්ෂණය කළ රටවල් 75 අතුරින් අනෙක් රටවල කිලෝ වොට් පැයක් සඳහා විදුලි බලය වැඩියෙන් ලාභ බව ය. ආයෝජන පැත්තෙන් මෙය ශ්‍රී ලංකාවට අවාසිදායක වේ.

එම වාර්තාවේ ම කර්මාන්ත ජලය සැපයුමට ශ්‍රී ලංකාව 58 වන ස්ථානය ද, ආරක්ෂිත නළ ජලය සම්බන්ධයෙන් 60 වන ස්ථානයේ ද විය. සමාජයීය වශයෙන් හෝ පුද්ගල වශයෙන් අපට වඩා හොඳ තත්ත්වයක් නොමැත.

සමාගම්වලට තම නිෂ්පාදන සඳහා වැයවන මුදල පියවා ගත යුතු බව පැහැදිලි ය. උපයෝගිතා මිල ඉහළ යාම නිෂ්පාදන තරඟකාරීත්වයක් ඇතිවීමට ආරම්භය වේ. මෙමගින් වැටුප් හා ව්‍යාපාරයන්ට යොදවන සම්පත් මත ප්‍රතිපීඩනයක් ඇති කරවයි. කෙටියෙන් පවසනවා නම් අඩු වැටුප් ව්‍යුහයක් නිසා ඉහළ වියදම් ඇතිවේ. උපයෝගිතා මිල පහළ ගිය විට සමාගම් වැටුප් වැඩි කිරීමට, පුහුණුවීම් ලබාදීමට, නැවත ආයෝජන කිරීමට නැඹුරු වේ.

අග්‍රාමාත්‍යතුමා ශ්‍රී ලංකාව යළි පිබිදීම යනුවෙන් අදහස් කරනුයේ සාමයෙන් පසු ඇතිවන පුනර්ජීවනයයි. කාලයෙන් සිදුවූ පාඩුව මකා ගැනීමයි. අපගේ කලාපයේ අනෙකුත් රටවල ආර්ථිකය වෙත යාම ය. ඒවා අප සැමට අභියෝග වේ. මේවා පහසු ජයග්‍රහණ නොවේ. එසේ ම, අප කථා කරනුයේ ඉතා මූලික දෙයක් පිළිබඳ ව ය. අප කථා කරනුයේ අප සැමගේ ජීවන තත්ත්වය වඩා යහපත් කිරීම පිළිබඳ ව ය. අපට ධනය ලබාගත යුතු බව, අපගේ ආර්ථිකයට දායකවීමට හා බෙදා හදා ගැනීමට අපගේ ජනතාවට හැකියාව ලබාදීම ය.

මහජන උපයෝගිතා කොමිසම සියල්ලට ම විසඳුම වේ ද? නැත. එය එක්තරා ක්‍රියාවලියක් පමණි. එහෙත්, එය කෙරීගෙන යන අතර පාලක ව්‍යුහයකට එය අත්‍යවශ්‍ය වේ. එය වේගවත් වර්ධනයකට හා රැකියා අවස්ථා සඳහා මූලික අවශ්‍යතාවයකි.

වැදගත් ජීවන තත්ත්වයක් ගොඩනැංවීමට අවශ්‍ය සේවාවන් ඇති කිරීමේ ව්‍යුහයක් ගැන මෙම පනත් කෙටුම්පතින් අද කථාබහට ලක්වේ. මෙය අපට එක් රැයකින් හෝ සමහර විට එක් දසකයකින් හෝ නිශ්චිතව ලබාගත හැකි දෙයක් නොවේ. කෙසේ වුව ද, නිවැරදි තැනින් අපට එය ආරම්භ කළ හැකිය. මෙය එවන් එක් නිවැරදි මාර්ගයකි.